# කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම (Card Balance Conversion Plan)

## නීතිරීති සහ කොන්දේසි

1. ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කින් කෝර්පරේෂන් ලිමිටඩ් ("බැංකුව" හෝ "HSBC") විසින් බැංකුවේ ආයතනික ක්‍රෙඩිට් කාඩ්පත්වලට හැර ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් ("ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්") වෙත ලබාදෙන කාඩ්පත් ශේෂය හැරවීමේ සැලසුම (Card Balance Conversion Plan – "CBC") බැංකුවේ පරම අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක අස්කරගැනීම හෝ සංශෝධනය කිරීම සිදුකළ හැකිය.

2. අවම ගනුදෙනු වටිනාකම ශ්‍රීලංරු.25,000/-ක් වන අතර, උපරිම ගනුදෙනු වටිනාකම ශ්‍රීලංරු.400,000/-ක් වේ. (මෙහි මින් මතු "සුදුසුකම් ලත් ගනුදෙනුව" වශයෙන් හැඳින්වේ).

3. විශේෂිත ප්‍රවර්ධනයන් සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් විශේෂිතව දක්වා නොමැති නම් හැර, සුදුසුකම් ලත් ගනුදෙනුවක්, මිළදී ගත් දින (transaction purchase date) සිට දින 90ක් ඇතුළත දී පමණක් CBC සැලසුමක් බවට හැරවිය හැකිය.

4. සුදුසුකම් ලත් ගනුදෙනුවක්, බැංකුව විසින් තීරණය කරනු ලබන සුළු හැසිරවීමේ ගාස්තුවක් යටතේ 3, 6, 12 හෝ 24 යන මාසික වාරික කාලසීමාවක දී ආපසු ගෙවිය හැකිය.

5. ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙහි ණයවර සීමාවෙන් CBC මූලික මුදල සහ හැසිරවීමේ ගාස්තුව සම්පූර්ණයෙන්ම අඩු කෙරෙනු ඇති අතර, ඉන් අනතුරුව එළඹෙන මාසවලදී මාසික වාරික බිල්ගත කර ගෙවීම් සිදුකෙරෙන විට මුදා හැරෙනු ඇත.

   ක්‍රෙඩිට් කාඩ්පතෙහි ගෙවිය යුතු අවම මුදලෙහි අඩංගු වනුයේ මාසික ණය වාරිකය සහ කාඩ්පතෙහි ගෙවීමට ඇති ශේෂයෙන් 4% මුදල යන සංකලනයකි. ඔහු/ඇය විසින් කාඩ්පත් වෙත සිදුකරන ලද ගෙවීම් ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන නීතිරීති සහ කොන්දේසි (කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුම) හි සඳහන් ගෙවීම් අනුපිළිවෙලට අනුව අදාළ වනු ඇති බව කාඩ්පත් හිමියා පිළිගනියි. (http://www.hsbc.lk/1/2/personal/credit-card/quick-consumer-guide හරහා දැක-බලා ගත හැකිය).

කාඩ්පත් හිමියා හට CBC වාරික බිල්ගත කෙරෙන අන්දම පිළිබඳ උදාහරණයක් පහතින් දැක්වේ.

මූලික ගනුදෙනු මුදල රු.100,000/-
හැසිරවීමේ ගාස්තුව රු.9,900/-
කාලසීමාව මාස 12යි

| මාසය | මාසික වාරිකය | මාසික හැසිරවීමේ ගාස්තුව | මාසික මූලික මුදල | ගෙවීමට නියමිත මූලික ශේෂය |
|---|---|---|---|---|
| 1 | 9,158.33 | 1,475.10 | 7,683.23 | 92,316.77 |
| 2 | 9,158.33 | 1,376.10 | 7,782.23 | 84,534.54 |
| 3 | 9,158.33 | 1,253.95 | 7,904.38 | 76,630.16 |
| 4 | 9,158.33 | 1,136.58 | 8,021.75 | 68,608.41 |
| 5 | 9,158.33 | 1,017.50 | 8,140.83 | 60,467.58 |
| 6 | 9,158.33 | 896.68 | 8,261.65 | 52,205.92 |
| 7 | 9,158.33 | 774.08 | 8,384.25 | 43,821.67 |
| 8 | 9,158.33 | 649.70 | 8,508.63 | 35,313.05 |
| 9 | 9,158.33 | 523.50 | 8,634.83 | 26,678.22 |
| 10 | 9,158.33 | 395.46 | 8,762.87 | 17,915.35 |
| 11 | 9,158.33 | 265.55 | 8,892.78 | 9,024.60 |
| 12 | 9,158.33 | 133.73 | 9,024.60 | (0.00) |

6. CBC මාසික වාරිකය, ඊළඟ ප්‍රකාශන දිනයේ දී වහාම කාඩ්පත් හිමියා වෙත බිල්ගත කෙරෙනු ඇත.

7. කිසියම් වාරික ගෙවීමක් කාඩ්පත් හිමියා විසින් පැහැර හැරියහොත්, ගෙවීමට නියමිතව හිඟව පවත්නා CBC මුදල නියමිත කාලයට පෙර වසා දමා, ගෙවීමට නියමිත සම්පූර්ණ හිඟ මුදල කාඩ්පතට හර කිරීමේ අයිතිය HSBC විසින් රඳවා ගනියි.

8. ක්‍රෙඩිට් කාඩ්පතෙහි ගෙවීමට නියමිත හිඟ මුදලට අතිරික්තව කරනු ලබන ගෙවීම් බිල්ගත නොකරන ලද වාරික ස්වයංක්‍රීයව යථාවත් කිරීමක් සිදු නොකෙරනු ඇති අතර, එය CBC පහසුකම සඳහා පූර්ව වශයෙන් කරන ලද ගෙවීමක් බවට නොසැලකෙනු ඇත.

9. නියමිත කාලයට පෙර CBC සැලසුම සම්පූර්ණයෙන් පියවීමට කාඩ්පත් හිමියා අදහස් කරන අවස්ථාවක දී, කාඩ්පත මත ඇති CBC සැලසුම අවසන් කිරීම සම්බන්ධයෙන් ඔහුගේ/ඇයගේ අදහස බැංකුව වෙත ලිඛිතව දන්වා සිටිය යුතු වේ. නියමිත කාලයට පෙර සිදු කරනු ලබන එවැනි පියවීමක දී, CBC සැලසුමෙහි ගෙවීමට නියමිතව ඉතිරිව තිබෙන මූලික මුදල මත, 4%ක නියමිත කාලයට පෙර පියවීමේ ගාස්තුවක් අයකෙරෙනු ඇත

10. අදාළ සියලුම වාරික ක්‍රෙඩිට් කාඩ්පතට යොමු කිරීමට පෙර කාඩ්පත් හිමියා විසින් ක්‍රෙඩිට් කාඩ්පත වසා දමනු ලැබුවහොත්, ගෙවීමට නියමිත හිඟ CBC මුදල, එක් ඒකාබද්ධ මුදලක් වශයෙන් ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට හර කෙරෙනු ඇත.

11. CBC පහසුකම ලබාගැනීම සම්බන්ධයෙන් කාඩ්පත් හිමියකු හට විඳින්නට, භාර ගන්නට හෝ දරන්නට සිදුවන හෝ කිසියම් නඩු කටයුත්තක්, හිමිකම් පෑමක්, ඉල්ලීමක්, හානියක්, පාඩුවක්, පිරිවැයක්, අයකිරීමක් සහ වියදමක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් HSBC වගවීමට හෝ වගකීමට ලක් නොකළ යුතු වේ.

12. මෙම පිරිනැමීම සඳහා වන නීතිරීති සහ කොන්දේසි, කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමට අමතරව මිස, ඒවා වෙනුවට නොවේ. මෙම පිරිනැමීම කාඩ්පත් හිමියන් සඳහා විශේෂ පහසුකමක් වශයෙන් පිරිනමනු ලබන අතර, මෙහි සඳහන් කිසිවක් මගින් කාඩ්පත් හිමියන් සඳහා වන ගිවිසුමට හානියක් හෝ බලපෑමක් හෝ ඇති නොකරයි.

මතභේද ඇතුලුව, නමුත් ඊට සීමා නොවී, මෙම පිරිනැමීමට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් බැංකුවෙහි තීරණය අවසානාත්මක වන අතර, මෙම පිරිනැමීම සම්බන්ධයෙන් සියලු කාඩ්පත් හිමියන් ඒ හා බැඳී සිටියි.

13. මෙම දීමනාවට සහභාගි වීම මගින්, මෙම නීතිරීති සහ කොන්දේසි සහ බැංකුවේ තීරණ සමඟ බැඳී සිටීමට කාඩ්පත් හිමියා එකඟ වේ.

14. මෙම නීතිරීති සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මඟින් පාලනය වන අතර, මේ පිළිබඳ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් විශේෂිත අධිකරණ බලය ශ්‍රී ලංකාවේ අධිකරණ සතු වේ.